**ශීර්ෂය 421 - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 08 ක් සඳහා සහ මූලධන වැය විෂයයන් 15 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදනය කර තිබූ පිළිවෙලින් එකතුව රු. 11,100,000 ක් හා එකතුව රු. 63,400,000 ක් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | 2021.08.28 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය මැයෙන් නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ප්‍රතිපාදන ඉතිරි කළ බව. | ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සලසා ඇති ප්‍රතිපාදන උපරිම අයුරින් උපයෝජනය කිරීමට කටයුතු කලයුතු වීම. |
| (ආ) | සැලසුම් සහගතව ප්‍රතිපාදන වෙන්කරවා නොගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයන් 08 කට අදාල එකතුව රු. 11,250,000 ක් හා මූලධන වැය විෂයයන් 20 කට අදාල එකතුව රු. 374,581,000 ක් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයන්ට මාරුකරගෙන තිබූ අතර එය සියයට 25 සිට සියයට 100 ක් දක්වා පරාසයක විය. | අපේක්ෂිත පරිදි වියදම් පැන නොනැගුණ නිසා අතිරික්ත ප්‍රතිපාදනය ඌන වැය විෂයයන් වෙත මාරු කරන ලද බව. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. |
| (ඇ) | නිසි සැලසුමකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයයන් 09 කට අදාල එකතුව රු. 327,656,000 ක් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයන්ගෙන් ලබාගෙන තිබුණි. එය සියයට 28 සිට සියයට 100 ක් දක්වා පරාසයක විය. ඉන් එකතුව රු. 1,958,354 ක් ඉතිරි වී තිබූ අතර එය සියයට 19 සිට සියයට 40 දක්වා වූ පරාසයක විය. | අපේක්ෂිත පරිදි වියදම් පැන නොනැගුන නිසා අතිරික්ත ප්‍රතිපාදන ඌන වැය විෂයයන් වෙත මාරු කරන ලදී. එසේම අනියම් ඉතිරිවීම් හා 2021.08.28 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය මැයෙන් නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව වියදම් පැන නොනැගීම හේතුවෙන් අතිරික්ත ප්‍රතිපාදන මාරු කරන ලද බව. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ප්‍රතිපාදන අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගත යුතු අතර ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කලයුතු වීම. |

## 2.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිලධාරීන් සේවය අතහැර යාම හා විශ්‍රාම යාම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයකරගෙන නොතිබූ එකතුව රු. 522,270 ක හිඟ ණය ශේෂ පැවති අතර හිඟහිටි කාලය වසර 03 සිට වසර 21 දක්වා පරාසයක විය. | මෙම ණයශේෂ විවිධ හේතු මත නිරවුල් වී නොමැති අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කර හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුවීම. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/ 2017 ට අනුව සියළු බැරකම් ලේඛනගත කළයුතු වුවත් රු. 220,967 ක් වටිනා බැරකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. | මෙහි සඳහන් කර ඇති වවුචර්පත් වල වටිනාකම් අතපසු වීම හේතුවෙන් බැරකම් ලේඛණයට ඇතුලත් නොවී ඇත.මින් ඉදිරියට නිවැරදිව හඳුනාගෙන සටහන් කරනු ලබන බව. | වර්ෂයට අදාල සියළු බැරකම්, බැරකම් ලේඛනයේ ඇතුලත් කිරීමට කටයුතු කල යුතුවීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i | මුදල් රෙගුලාසි 756,757 හා 1647 (ආ) | වාහන හා අමතර උපකරණ පිළිබඳව වාර්ෂික සමීක්ෂණ පැවැත්විය යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | විවිධ අපහසුතා හේතුවෙන් වාහන සමීක්ෂණය නියමිත දිනට සිදු කර ගත නොහැකි වීම හේතුවෙන් වාර්තාව ඔබ වෙත යොමු කිරීමට නොහැකි වූ බව. | වාහන හා අමතර උපකරණ පිළිබඳව වාර්ෂික සමීක්ෂණ පැවැත්වීමට කටයුතු කල යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| ii | මුදල් රෙගුලාසි 1646 | ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමග ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිවරයා වෙත යැවිය යුතු වුවත් අමාත්‍යාංශය සතු සංචිත වාහන 22 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විවිධ වූ හේතු මත අළුත්වැඩියා කටයුතු සිදු නොකිරීම නිසා වාහන කිහිපයක් ධාවනය කර නොතිබීමත්, වාහන කිහිපයක් අවශ්‍ය කටයුතු සඳහා අදාල ආයතන වෙත පවරා දී ඇති නිසාත් ධාවන සටහන් නිසි පරිදි ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවීම. |
| (ආ) | 2015 ජූලි 14 දිනැති අංක 03/ 2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අවස්ථා 19 කදී ලබාදී තිබූ ඉන්ධන හා විවිධ අත්තිකාරම් පියවීමේ ප්‍රමාදය මාස 01 සිට මාස 04 ක් දක්වා වූ කාල පරාසයක පැවතුණි. මේ තත්ත්වය මීට ඉහතදී පෙන්වා දී ඇතත් වර්තමානයේදීද නිවැරදි කරගෙන නොතිබුණි. | කෝවිඩ් වසංගත තත්ත්වය හා බිල්පත් අස්ථානගත වීම වැනි විශේෂ හේතූන් බලපාන ලද බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුවීම. |
| (ඇ) | 2009 ජුනි මස 17 දිනැති අංක 09/ 2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් පරිදි අමාත්‍ය කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ පැමිණීම පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගැනීමකින් තොරව 2021 වර්ෂය තුල එකතුව රු.9,212,498 ක් වැටුප් සහ දීමනා ලෙස ගෙවා තිබුණි. | 2021 වර්ෂය තුළදී පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(V)හා 2021/10/01 දිනැති චක්‍රලේඛයේ 7 වන ඡේදයට අනුව රාජ්‍ය නිලධරයන් සේවයට වාර්තා කිරීම සම්බන්ධයෙන් පැමිණීමේ හා පිටවීමේ ලේඛණයක් පමණක් නඩත්තු කිරීම<br><br>ප්‍රමාණවත් බවද දක්වා ඇත. ඒ අනුව, පැමිණීමේ හා පිටවීමේ ලේඛණයක් පවත්වාගෙන යන ලදී. | චක්‍රලේඛයේ උපදෙස් අනුව අවශ්‍ය කාර්යයන් ඉටු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2016 මාර්තු 29 දිනැති ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යෝජනා ක්‍රමයේ II අදියර ගිවිසුම | | | |
| i | 3.2 ඡේදයේ වගන්තිය (f) | II වැනි ගිණුම් වර්ෂය අවසන් වී තුන් මාසයක් ඇතුලත SEPI Loan Scheme – Phase 11 සම්බන්ධයෙන් මහ බැංකුව විසින් ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි. | ගිවිසුමේ 3.2 ඡේදයේ (f) වගන්තිය අනුව ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ වගකීම මහ බැංකුව සතු බව. | ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| ii | ගිවිසුමේ 2.2 ඡේදයේ වගන්තිය (b) | ණය මුදල් ලබාදීමට අදාල සියළුම ඉල්ලුම්පත් අමාත්‍යාංශයේ මැදිහත් වීමකින් තොරව 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ලියාපදිංචි කල ප්‍රතිලාභීන් 1,295 කින් ප්‍රතිලාභීන් 1,109 ක් වෙනුවෙන් රු. 491,134,875 ක ණය මුදලක් ලබාදී තිබුණි. ණය ලබාදෙන බැංකු විසින්ම එම ණයලාභීන් තෝරාගෙන ණය ප්‍රදානය කරතිබූ අතර එම ක්‍රියාවලිය මේ දක්වාද එලෙසම සිදු වෙමින් පවතින බව විගණනයේදී අනාවරණය විය. | වෘත්තීය පුහුණු ආයතනවල වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් හරහා, ණය ලබා ගැනීමට අපේක්ෂිත සිසුන් අදාල ප්‍රාදේශීය බැංකු ශාඛාවන් වෙත ඉදිරිපත් කරනු ලබන බව හා මහ බැංකුව විසින් නිකුත් කර ඇති මෙහෙයුම් නියෝගයන්හි දක්වා ඇති නිර්ණායකයන් සපුරනු ලබන අයදුම්කරුවන් සඳහා ණය ලබාදීම සිදුකරනු ලබන බව. | අදාල ගිවිසුමේ සඳහන් කරුණු වලට අනුව කටයුතු කල යුතුවීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් සහිත **(NVQ)** පාඨමාලා දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් අධ්‍යාපන හා පුහුණුව ලබාදීමට නම් ප්‍රතීතනය කිරීම අත්‍යාවශ්‍යය වුවද 2018 වර්ෂයේ සිට 2022 ජනවාරි 18 දින දක්වා ලැබී තිබූ අයදුම්පත් 343 ක් සඳහා වාර්තාවේ දිනය දක්වා ප්‍රතීතන සහතික නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | ඇතැම් පාඨමාලා ප්‍රතීතනය කිරීමට නොහැකි වී ඇත්තේ අවශ්‍ය නිර්ණායක සපුරා නොමැති වීම මත බව. | ගුණාත්මක තත්ත්වයෙන් යුතු දේශීය හා ජාත්‍යන්තරව පිළිගත් අධ්‍යාපනය හා පුහුණුව සඳහා ප්‍රතීතනය කිරීම අත්‍යාවශ්‍ය බැවින් එම කටයුතු කාර්යක්ෂමව ඉටුකල යුතුවීම. |
| (ආ) (i) අදියර 02 ක් යටතේ ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය **(SEPI)** යෝජනා ක්‍රමය යටතේ 2020 වර්ෂයේ කිසිඳු ණය ඉල්ලුම් පත්‍රයක් ලියාපදිංචි කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 90 ක් ඇස්තමේන්තුගත කර තිබුණද නිසි ණය මුදල් සැලසුමක් නොමැති වීම හා ඉලක්කගත ප්‍රතිලාභීන් ගණන තීරණය කර නොතිබීම හේතුවෙන් වෙන්කරන ලද මුදලින් රු.මිලියන 80 ක් එනම් සියයට 89 ක් වෙනත් වැය විෂයයකට මාරු කර තිබුණි. වර්ෂය තුළදී ණයලාභීන් තිදෙනෙක් පමණක් ලියාපදිංචි කර ඔවුන් වෙත රු. ලක්ෂ 05 බැගින් රු. මිලියන 1.5 ක් බෙදා දී තිබුණි. | 2020 වර්ෂයේ රට තුළ කොරෝනා වසංගත තත්වය හේතුවෙන් රට වසාදමා තිබීම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය නිකුත් කිරීමක් සිදුකර නොමැත. | මෙම ණය යෝජනා ක්‍රමයෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුවන පරිදි ණයලාභීන් වැඩි කර ගැනීමට කටයුතු කල යුතුවීම. |
| (ii) ණය ගිවිසුම ප්‍රකාරව ස්වයං රැකියා ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික උපකරණ හා අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වුවද ණය ලබාදිය හැකි වුවද සියයට 38 කට ආසන්න පිරිසක් ව්‍යාපාර පුළුල් කරගැනීම සඳහා ණය ලබාගෙන තිබුණි. සියයට 14 කට ආසන්න ප්‍රතිශතයක් අදාල ණය මුදල උපයෝජනය කර නොතිබුණි. | ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වමින් අමාත්‍යාංශ නිලධාරීන් විසින් ශ්‍රී ලංකා මහබැංකුව, ප්‍රතිලාභී ආයතන හා බැංකු යන ආයතනවල නිලධාරීන් සමඟ සාකච්ඡා කර ගැටළු සහගත තත්වයන් මඟ හරවා ගැනීමට ක්‍රියා කර ඇත. | ණය ලබාදෙන මූලිකම පරමාර්ථ ඉටු වුවාද යන්න පසුවිපරම් කටයුතු සිදු කිරීමට කලමනාකරණය කටයුතු කල යුතුවීම. |

අමාත්‍යාංශයේ මැදිහත්වීම හා පසු විපරම් කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් ණය යෝජනා ක්‍රමයේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව විගණනයේදී අනාවරණය විය.

## 3.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ජනවාරි 04 දිනැති අංක 2209/14 දරන ගැසට් පත්‍රයේ සුවිශේෂී ප්‍රමුඛතා යටතේ හඳුනාගන්නා ලද නගර විශ්වවිද්‍යාල 05 ක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද වර්ෂය අවසන් වන විට රු. මිලියන 6.11 ක් වැය කර නගර විශ්වවිද්‍යාල 03 ක පමණක් මූලික ඉදිකිරීම් හා ඉඩම් පවරාගැනීම් කටයුතු ආරම්භ කර තිබුණි. | ශක්‍යතා අධ්‍යයන සිදුකරන ලද දිස්ත්‍රික්ක 8 හි දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් මේ පිළිබඳව විමසා බලන ලද අතර, පවත්නා භෞතික සම්පත් පිළිබඳව අමාත්‍යාංශයේ නිලධාරීන් සහ පුරවර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන උපදේශකවරයා විසින් දිස්ත්‍රික් මට්ටමින් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකරන ලද බව. | අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට ක්‍රියා කල යුතුවීම. |
| (ආ) | වෘත්තීය අධ්‍යාපනයට යොමුවන ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණ කරමින් තරුණ ප්‍රජාව සඳහා වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම අරමුණු කරගෙන වෘත්තීය පුහුණුවේ යෙදෙන සිසුන් සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය යොජනා යටතේ රු. මිලියන 500 ක ප්‍රතිපාදන මත සිසුන් 55,000 කට ශිෂ්‍යාධාර ලබාදීමට ඉලක්ක කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විට සිසුන් 26,730 කට ශිෂ්‍යාධාර ලෙස රු. මිලියන 142.4 ක් ලබාදී තිබුණි. | 2021 වර්ෂයේ පෙබරවාරි සිට ශිෂ්‍යාධාර ක්‍රමය ක්‍රියාත්මක කල අතර එම කාලපරිච්ඡේදයේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් ආරම්භක පියවර වශයෙන් ශිෂ්‍යාධාර සඳහා සුදුසුකම් ලබන සිසුන්ගෙන් තොරතුරු එක් රැස් කර අප වෙත එවීමට සැලකිය යුතු මාස ගණනක් ගත වූ බව. | -එම- |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 ජුනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව රු. මිලියන 434 ක පිරිවැයක් දරමින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ස්ථාපිත කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. එහෙත් උපදේශාත්මක සේවා ලබා ගැනීම හා කාර්යමණ්ඩල නේවාසිකාගාරයක් | කින්නියා විශ්වවිද්‍යාල විද්‍යායතනයේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යොමු කරන ලද අතර අනුමැතිය ලබා දී ඇත්තේ නිපුණතා ආංශික සංවර්ධන අංශයට වෙන් වූ ප්‍රතිපාදන යොදවා ඉදිකිරීම් කටයුතු සිදුකර ගැනීම සඳහාය. ඒ අනුව නිපුණතා ආංශික සංවර්ධන | අවශ්‍යතාවය ඉටුකර ගැනීමට හැකි ලෙස ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ඉදිකිරීම සඳහා රු. 8,931,683 ක් 2019 වර්ෂයේදී වැයකර තිබුණද විද්‍යායතනය ඉදි නොකිරීම හේතුවෙන් ඉදිකරන ලද නේවාසිකාගාරය 2021 දෙසැම්බර් 31 දක්වාම නිශ්කාරයව පැවතුණි. | අංශය ජුනි මාසයෙන් අවසන් වන බැවින් ඒ සඳහා 2022 වසරට ප්‍රතිපාදන වෙන් වී නොමැති බව. | |
| (ආ) | කිලිනොච්චිය ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ සිසුන් 400 දෙනෙකු සඳහා රු. මිලියන 300 ක පිරිවැයක් යටතේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීමට 2017 වර්ෂයේදී ලැබී තිබූ අනුමැතිය මත 2018 වර්ෂයේදී උපදේශක සේවා ගාස්තු ගෙවීම සඳහා රු. 6,028,015 ක් වැයකර තිබුණි. එහෙත් 2022 ජුනි 30 දක්වා ශිෂ්‍ය නේවාසිකාගාරය ඉදි කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වැය කරන ලද මුදල් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | යෝජිත ව්‍යාපෘතිය සඳහා උපදේශකයකු තෝරා ගැනීම ප්‍රමාද විය. පසුගිය වර්ෂ වලදී 2018 සහ 2019 නිපුණතා ආංශික සංවර්ධන අංශයට වෙන් වූ මූල්‍ය ප්‍රතිපාදන සීමා වීම, ප්‍රසම්පාදන කමිටුවට සාමාජිකයින් පත් කිරීම ප්‍රමාද වීම සහ රාජකාරීමය සහ සෞඛ්‍ය හේතු මත ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් ඉවත් වීම යන හේතුන් නිසාද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වූ බව. | සැලසුම් කල කාලය තුල ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමට කටයුතු කල යුතුවීම. |
| (ඇ) | 2017 වසරේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව 2018 වර්ෂයේ ආරම්භ කර එම වර්ෂය අවසාන වන විට නිම කිරීමේ අරමුණ ඇතිව රු. මිලියන 80 ක් පිරිවැය වූ සමාජයීය නවෝත්පාදන පරීක්ෂණාගාරයක් (Social Innovation Lab) ආරම්භ කිරීමේ යෝජනාව ඉදිරිපත් වී තිබුණි. ඒ සඳහා අමාත්‍යාංශ ලේකම් හා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) අධ්‍යක්ෂ විසින් එකඟතාවයට පැමිණ අත්සන් තබා තිබුණි. වර්ෂ 2017 සිට 2018 වර්ෂය දක්වා එහි මෙහෙයුම් කටයුතු සඳහා රු. මිලියන 35 ක් වැයකර තිබුණද එම වියදමට අදාළ කිසිදු ලිඛිත සාක්ෂියක් හෝ කිසිදු ඵලදායී තීරණයක් ගත් බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ අනුව වැයකරන ලද රු. මිලියන 35 නිෂ්කාර්ය වියදමක් බව විගණනයේදී අනාවරණය විය. | ගෝලීය වශයෙන් පිළිගත් ප්‍රමිතීන්ට අනුව එම පරීක්ෂණාගාරයේ කටයුතු ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2017 වසරේ සැප්තැම්බර් මස 27 වන දින ලැබී ඇති අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ව්‍යාපෘති ලේඛනය 2017 වසරේ සැප්තැම්බර් මස 22 වන දින විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්තුමා හා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ **(UNDP)** අධ්‍යක්ෂ විසින් එකඟතාවයකට පැමිණ අත්සන් තබා ඇති බව. | ප්‍රතිපාදන ඵලදායී හා කාර්යක්ෂම ලෙස යෙදවීමට වගබලා ගත යුතුවීම. |

**3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | i. 2016 පෙබරවාරි 11 දිනැති අංක අමප/16/0167/716/008 දරන කැබිනට් පත්‍රිකාවෙන් ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට ලබාදී තිබූ අනුමැතිය මත අවශ්‍ය ඉඩම් කොටස පවරා ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 280 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු මාස 24 ක් තුල නිම කිරීම සඳහා රු. 2,819,711,538 ක් ඇස්තමේන්තුගත කර තිබුණද ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | 2017 වසර සඳහා ලැබූ ප්‍රතිපාදන මුදලින් රු. මිලියන 100ක් හා 2018 වසරේ රු. මිලියන 80ක් ඉඩම් කොටස වෙන් කර ගැනීම සඳහා ගෙවීම් කරන ලද බවත්.**CECB** සහ **CESL** ආයතන සමඟ ගිවිසුම්ගත වුවද ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වූ බැවින් ගිවිසුම්ගත ප්‍රකාරව කටයුතු සිදුකිරීමට නොහැකි වූ බවත්. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු නිම කල යුතු අතර ඉතිරි කාර්යයන් කඩිනම් කිරීමට කටයුතු කල යුතු වීම. |
| | ii. යෝජිත මධ්‍යස්ථානය ඉදිකිරීමේ ඉඩම වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීම සඳහා වූ රු. 7,837,061 ක ඇස්තමේන්තුව අධ්‍යක්ෂක (වි.ප.ස) වෙත ඉදිරිපත් කිරීමට මාස 03 ක කාලයක් ප්‍රමද වීම හේතුවෙන් අතුරු සම්මත ගිණුම යටතේ ලබාදුන් රු. මිලියන 25 ක් අදාල කටයුතු සඳහා යොදවා ගැනීමට නොහැකි වී තිබුණි. 2022 ජනවාරි විගණිත දිනය වන විටත් වැටෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | වියදම් පිරිමැසුම් තාක්ෂණය උපයෝගී කර ගනිමින් රාජ්‍ය ආයතන වල ඉදිකිරීම් වලට අදාල උපදේශක කටයුතු, සැලසුම් කිරීම හා ඉදිකිරීම ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැරව සෘජුවම සිදු කිරීම ට 2018.03.21 දිනැති කැබිනට් මණ්ඩල තීරණයෙන් ඉඩ ලබා දී ඇති බැවින් **NERDC** ආයතනයෙන් ඇස්තමේන්තු ලබා ගෙන ඇති බව. | නියමිත කාලය තුළ අපේක්ෂිත ඉදිකිරීම් ඉටුකර ගැනීමට කටයුතු කල යුතුවීම. |
| (ආ) | විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන හරහා 2030 වසරේදී සංවර්ධිත දේශයක් බවට පත් කිරීම දැක්ම කරගත් පර්යේෂණ හා නව නිපැයුම් අංශයට අදාලව විශේෂ ප්‍රමුඛතා ක්ෂේත්‍ර 06 ක් හඳුනාගෙන තිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ හඳුනාගත් ව්‍යාපෘති 05 ක් සඳහා රු. මිලියන 80 ක් වෙන් කරවා තිබුණද ඉන් අපේක්ෂිත අරමුණු කරා ළඟාවීම වෙනුවෙන් වැයකර තිබුණේ රු. මිලියන 7.68 ක් එනම්, සැලසුම් කරන ලද මුදලින් සියයට 9.6 ක් පමණි. | ප්‍රධාන වශයෙන් පර්යේෂණ සුපරීක්ෂණය සඳහා ජාතික මට්ටමේ නව දත්ත පද්ධතියක් පිහිටුවීම, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 ට අනුව පර්යේෂණ දීමනා ගෙවීමට අදාල කටයුතු සිදු කිරීම , පර්යේෂණ හා නව නිපයුම් වානිජකරණය සඳහා ක්‍රමවේදයක් සැකසීම යන ක්‍රියාකාරම් සඳහා යොදා ගැනීමට නියමිතව තිබිණි .නමුත් මෙහි දත්ත පද්ධතිය ගොඩ නැගීම සහ පර්යේෂණ හා නව නිපයුම් වානිජකරණය සඳහා | සැලසුම් කල කාර්යයන් නියමිත කාලය තුළ ඉටු කර ගැනීමට කටයුතු කල යුතුවීම. |

ක්‍රමවේදයක් සැකසීම යන ක්‍රියාකාරකම් ලේකම්තුමියගේ උපදෙස් පරිදි නැවත්වීමට සිදුවූ අතර කොවිඩ් වසංගත තත්වය යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් ද මන්දගාමී විය.